32237

OL/2025(2026)/64/S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**64 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
**General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)**

දෙවන බස - සිංහල I, II
இரண்டாம் மொழி - சிங்களம் I, II
Second Language - Sinhala I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**வினாப்பத்திரத்தை வாசித்து, வினாக்களைத் தெரிவுசெய்வதற்கும் விடை எழுதும்போது முன்னுரிமை வழங்கும் வினாக்களை ஒழுங்கமைத்துக் கொள்வதற்கும் மேலதிக வாசிப்பு நேரத்தைப் பயன்படுத்துக.**

**Use additional reading time to go through the question paper, select the questions you will answer and decide which of them you will prioritise.**

## දෙවන බස - සිංහල I    இரண்டாம் மொழி - சிங்களம் I    Second Language - Sinhala I

උපදෙස්:

- ✳ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ✳ අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරා ගන්න.
- ✳ ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
- ✳ එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

அறிவுறுத்தல்கள்:

- ✳ **எல்லா வினாக்களுக்கும் விடை எழுதுக.**
- ✳ **1** தொடக்கம் **40** வரையுள்ள வினாக்கள் ஒவ்வொன்றிலும். (1), (2), (3), (4) என எண்ணிடப்பட்ட விடைகளில் **சரியான அல்லது மிகப் பொருத்தமான** விடையைத் தெரிவுசெய்க.
- ✳ **உமக்கு வழங்கப்பட்டுள்ள விடைத்தாளில் ஒவ்வொரு வினாவுக்கும் உரிய வட்டங்களில் உமது விடையின் எண்ணை ஒத்த வட்டத்தினுள்ளே புள்ளடியை (X) இடுக.**
- ✳ அவ்விடைத்தாளின் மறுபக்கத்தில் தரப்பட்டுள்ள மற்றைய அறிவுறுத்தல்களையும் கவனமாக வாசித்து, அவற்றையும் பின்பற்றுக.

**Instructions:**

- ✳ *Answer **all** questions.*
- ✳ *In each of the questions from* **1** *to* **40,** *pick one of the alternatives* (1), (2), (3), (4) *which you consider is* ***correct or most appropriate.***
- ✳ ***Mark a cross (X) on the number corresponding to your choice in the answer sheet provided.***
- ✳ *Further instructions are given on the back of the answer sheet. Follow them carefully.*

---

- අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවල, **තද කළු අකුරෙන්** මුද්‍රිත පදය වෙනුවට යෙදිය හැකි වඩාත් සුදුසු පද යුගලය තෝරන්න.
  **1** தொடக்கம் **5** வரையுள்ள வினாக்களில் **தடித்த எழுத்தில்** தரப்பட்டுள்ள சொற்களுக்குப் பதிலாக இடத்தக்க மிகவும் பொருத்தமான சொற்சோடியைத் தெரிவுசெய்க.
  Select the most suitable pair of words for the word printed in **bold letters** in questions from No. **1** to **5**.

**1.** එයා **අපිත්තෙක්ක** තරහ ද?
(1) අපි + තෙක්ක    (2) අපිත් + තෙක්ක    (3) අපි + එක්ක    (4) අපිත් + එක්ක

**2.** අනේ මම කොහොම ද **පොතුත්තරන්** වතුරට බහින්නේ ?
(1) පොත් + අරන්    (2) පොතුත් + අරන්    (3) පොතු + තරන්    (4) පොතු + අරන්

[ 2 වැනි පිටුව බලන්න / பக். 2 ஐப் பார்க்க / *see page two*

**3.** අපට වැඩිවෙලාවක් අන්තර්ජාලය භාවිත **කරන්නෙපා** කිව්වා.
(1) කරන්න + පා (2) කරන්නෙ + පා (3) කරන්න + එපා (4) කරන්නෙ + එපා

**4.** තාත්තයි ඔයයි චිත්‍රපටිය **බලන්නැද්ද** ?
(1) බලනවා + නැද්ද (2) බලන්න + නැද්ද (3) බලන්නේ + නැද්ද (4) බලන් + නැද්ද

**5.** මම හෙට නුවර **යන්නෝනෑ**
(1) යන්න + ඕනෑ (2) යන + ඕනෑ (3) යන් + නෝනෑ (4) යන් + ඕනෑ

- අංක **6** සිට **10** තෙක් ප්‍රශ්නවල දී ඇති පද අතුරෙන් **නිවැරදි උච්චාරණය** සහිත උත්තරය තෝරන්න.
**6** தொடக்கம் **10** வரையான வினாக்களில் தரப்பட்டுள்ள சொற்களில் **சரியான உச்சரிப்பைத்** தரும் விடையைத் தெரிவுசெய்க.
Select the answer with **correct pronunciation** from the words given in questions from No. **6** to **10**.

**6.** (1) ජාතික බක්ෂියා (2) ජාතික පක්ෂියා (3) ජාතිග පක්ෂියා (4) ජාතිග බක්ෂියා
**7.** (1) මට වළක් (2) මඩ වළක් (3) මත වලක් (4) මද වලක්
**8.** (1) තුස්කර ප්‍රදේස (2) දුෂ්ගර ප්‍රදේෂ (3) දුස්කර බ්‍රදේශ (4) දුෂ්කර ප්‍රදේශ
**9.** (1) ටිකිරි ගොටුව (2) ටිගිරි කොටුව (3) ඩිකිරි ගොටුව (4) ටිකිරි කොටුව
**10.** (1) ගොඩු කොළ (2) කොටු ගොළ (3) ගොටු කොළ (4) ගොඩු ගොළ

- අංක **11** සිට **14** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය සඳහා **වඩාත් ගැළපෙන** ප්‍රශ්නය තෝරන්න.
**11** தொடக்கம் **14** வரையான ஒவ்வொரு கூற்றுக்கும் **மிகப்பொருத்தமான** வினாவைத் தெரிவுசெய்க.
Select the **most appropriate** question for each statement given from No. **11** to **14**.

**11.** පොලිස් ස්ථානාධිපතිතුමා මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දේශනයක් කළේ ය.
(1) පොලිස් ස්ථානාධිපතිතුමා දේශනය කළේ කවද් ද?
(2) පොලිස් ස්ථානාධිපතිතුමා දේශනය කළේ කුමක් ගැන ද?
(3) පොලිස් ස්ථානාධිපතිතුමා දේශනය කළේ ඇයි?
(4) පොලිස් ස්ථානාධිපතිතුමා දේශනය කළේ කොහොම ද?

**12.** ප්‍රථමාධාර කමිටුව නම් කරනු ලැබුවා.
(1) නම් කරනු ලැබුවේ කුමක් සඳහා ද? (2) නම් කරනු ලැබුවේ කොහෙදී ද?
(3) නම් කරනු ලැබුවේ කවද්ද? (4) නම් කරනු ලැබුවේ මොකද්ද?

**13.** පාරිසරික විනාශයන් නිසා මහා ආපදා තත්ත්වයක් ඇති වුණි.
(1) මහා ආපදා තත්ත්වයක් ඇති වුණේ කවුරුන් නිසා ද?
(2) මහා ආපදා තත්ත්වයක් ඇති වුණේ ඇයි?
(3) මහා ආපදා තත්ත්වයක් ඇති වුණේ කීයට ද?
(4) මහා ආපදා තත්ත්වයක් ඇති වුණේ කුමක් සඳහා ද?

**14.** දේදුගල-පැලැම්පිටිය මාර්ගය දේදුගල ආසන්නයේ කැඩී යාමෙන් බස් ගමනාගමනය සම්පූර්ණයෙන් නැවතිණ.
(1) බස් ගමනාගමනය නැවතුණේ කොහේ ද? (2) බස් ගමනාගමනය නැවතුණේ කීයට ද?
(3) බස් ගමනාගමනය නැවතුණේ ඇයි? (4) බස් ගමනාගමනය නැවතුණේ කවදා ද?

- අංක **15** සිට **17** තෙක් ප්‍රශ්නවල **නිවැරදි ව අකුරු** යෙදී ඇති උත්තරය තෝරන්න.
**15** தொடக்கம் **17** வரையான வினாக்களில் **சரியான எழுத்துக்கூட்டலைக்** கொண்ட சொல்லைத் தெரிவுசெய்க.
Select the answer with **correct spellings** in questions from No. **15** to **17**.

**15.** (1) වෛයිද්‍යවරයකු (2) වෙයිද්‍යවරයකු (3) වයිද්‍යවරයකු (4) වෛද්‍යවරයකු
**16.** (1) කාර්‍යාලයෙන් (2) කාර්යාලයෙන් (3) කායර්යාලයෙන් (4) කාර්‍යාලයෙන්
**17.** (1) ප්‍රයෝගික (2) ප්‍රරයෝගික (3) ප්‍රායෝගික (4) ප්‍රර්ායෝගික

- අංක **18** සිට **20** තෙක් ප්‍රශ්නවල **නොගැළපෙන** පදය තෝරන්න.
**18** தொடக்கம் **20** வரையான வினாக்களில் **பொருத்தமற்ற** சொல்லைத் தெரிவுசெய்க.
Select the **inappropriate** word in questions from No. **18** to **20**.

**18.** (1) අද (2) හවස (3) හෙට (4) අනිද්දා
**19.** (1) කිලෝව (2) තුන්කාල (3) භාගය (4) කාල
**20.** (1) කාලගුණය (2) නැගෙනහිර (3) දකුණ (4) උතුර

[ 3 වැනි පිටුව බලන්න / பக். 3 ஐப் பார்க்க / *see page three*

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- අංක **21** සිට **23** තෙක් ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් දෙන පදය** තෝරන්න.
**21** தொடக்கம் **23** வரையான வினாக்களில் ஆரம்பத்தில் தரப்பட்டுள்ள சொல்லுக்கு **ஒத்தகருத்தைத் தரும் சொல்லைத்** தெரிவுசெய்க.
Select the **synonym** for the word given at the beginning in questions from No. **21** to **23**.

**21.** සුළඟ : (1) වතුර (2) ගගන (3) විදුලි (4) පවන

**22.** ජයග්‍රහණය: (1) එකමුතු (2) දිනුම (3) සමගිය (4) සාමය

**23.** කොඩිය : (1) කොණ්ඩය (2) කණ්ණාඩිය (3) ධජය (4) ධවල

- අංක **24** සහ **25** ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට **විරුද්ධාර්ථයක් දෙන පදය** තෝරන්න.
**24, 25** ஆகிய வினாக்களில் ஆரம்பத்தில் தரப்பட்டுள்ள சொல்லுக்கு **எதிர்கருத்தைத் தரும் சொல்லைத்** தெரிவுசெய்க.
Select the **antonym** for the word given at the beginning in questions No. **24** and **25**.

**24.** එපා : (1) පුළුවන් (2) බැහැ (3) ඕනැ (4) නැහැ

**25.** ඇති : (1) හැකි (2) බැරි (3) අකමැති (4) නැති

- අංක **26** සිට **28** තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති පින්තූරය සඳහා **වඩාත් ගැළපෙන අදහස** දැක්වෙන වරණය තෝරන්න.
**26** தொடக்கம் **28** வரையான ஒவ்வொரு வினாவிலும் தரப்பட்டுள்ள படத்துக்கு **மிகப் பொருத்தமான கருத்தைத்** தரும் விடையைத் தெரிவுசெய்க.
Select the option that gives the **most suitable idea** for the picture given in each question from No. **26** to **28**.

**26.**



(1) වාහන ඇතුළු වීම තහනම්
(2) වංගු සහිත මාර්ගයකි
(3) පාර ලිස්සනසුලු ය
(4) අනතුරු සහිත ප්‍රදේශයකි

**27.**



(1) හදිසි පිටවීමේ දොරටුව
(2) ඉක්මනින් ඇතුළු වන්න
(3) පදිකයන් මාරුවන ස්ථානය
(4) දොරටුවෙන් පමණක් ඇතුළු වන්න

**28.**



(1) මිනිසුන් වැඩ කරන ස්ථානය ඉදිරියෙනි
(2) කඳු සහිත පටු මාර්ගය ඉදිරියෙනි
(3) නාය ගිය ස්ථානය ඉදිරියෙනි
(4) උමං සහිත පටු මාර්ගය ඉදිරියෙනි

- අංක **29** සහ **30** ප්‍රශ්නවලට **ගැළපෙන උත්තරය** තෝරන්න.
**29, 30** ஆகிய வினாக்களுக்குப் **பொருத்தமான விடையைத்** தெரிவுசெய்க.
Select the **suitable answer** for questions No. **29** and **30**.

**29.** ජීවත් වීම සඳහා කරනු ලබන රැකියාව
(1) ජීවිතාශාව වේ. (2) ජීවනාධාර වේ. (3) ජීවනෝපාය වේ. (4) ජීවිතාරක්ෂාව වේ.

**30.** කිසිම උත්සාහයක් දැරීමට අකමැති පුද්ගලයා
(1) උත්සාහවන්තයා වේ. (2) කම්මැළියා වේ. (3) කුම්මැහියා වේ. (4) දේශප්‍රේමියා වේ.

- අංක **31** සහ **32** ප්‍රශ්නවල වාක්‍ය දෙක බැගින් දී ඇත. එම වාක්‍ය දෙක එක් වාක්‍යයක් ලෙස **නිවැරදි ව** සම්බන්ධ කර **ලියා ඇති වාක්‍යය** තෝරන්න.
**31, 32** ஆகிய வினாக்களில் இரு வாக்கியங்கள் வீதம் தரப்பட்டுள்ளன. அந்த இரு வாக்கியங்களையும் சரியாக இணைத்து ஒரு வாக்கியமாக்கி **எழுதப்பட்டுள்ள வாக்கியத்தைத்** தெரிவுசெய்க.
In questions No. **31** and **32,** two sentences each are given. Select the **sentence** that **correctly** combines the two sentences.

**31.** තේ වගා කරනවා. කඳුකරයේ ගස් කපා පරිසරය විනාශ කරනවා.
(1) තේ වගා කිරීම සඳහා කඳුකරයේ ගස් කපා පරිසරය විනාශ කරනවා.
(2) තේ වගා කිරීමෙන් කඳුකරයේ ගස් කපා පරිසරය විනාශ කරනවා.
(3) තේ වගා කිරීම නිසා කඳුකරයේ ගස් කපා පරිසරය විනාශ කරනවා.
(4) තේ වගා කිරීම හේතුවෙන් කඳුකරයේ ගස් කපා පරිසරය විනාශ කරනවා.

[ 4 වැනි පිටුව බලන්න / பக். 4 ஐப் பார்க்க / *see page four*

**32.** හොරකම, අල්ලස, දූෂණය පිටුදකිනවා. රට නිවැරදි මාවතට පත්වෙනවා.
(1) හොරකම, අල්ලස, දූෂණය පිටුදැකීමෙන් රට නිවැරදි මාවතට පත්වෙනවා.
(2) හොරකම, අල්ලස, දූෂණය පිටුදැකීම සඳහා රට නිවැරදි මාවතට පත්වෙනවා.
(3) හොරකම, අල්ලස, දූෂණය පිටුදැකීමට රට නිවැරදි මාවතට පත්වෙනවා.
(4) හොරකම, අල්ලස, දූෂණය පිටුදැකීම වෙනුවෙන් රට නිවැරදි මාවතට පත්වෙනවා.

● අංක **33** සහ **34** ප්‍රශ්නවල හිස්තැනට **වඩාත් සුදුසු උත්තරය** තෝරන්න.
**33, 34** ஆகிய வினாக்களிலுள்ள இடைவெளிக்கு **மிகவும் பொருத்தமான சொல்லைத்** தெரிவுசெய்க.
Select the **most suitable answer** to fill in each blank in questions No. **33** and **34**.

**33.** මධ්‍යම කඳුකරයේ නැගෙනහිර බෑවුම් ...................... සුළඟේ වේගය පැයට කිලෝමීටර පනහක් දක්වා වර්ධනය විය හැකි ය.
(1) ප්‍රදේශවලින් (2) ප්‍රදේශවලට (3) ප්‍රදේශයෙහි (4) ප්‍රදේශ මගින්

**34.** ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය නගාසිටුවීම, රටේ ආර්ථිකය ශක්තිමත් ...................... ගනු ලැබූ වැදගත් තීරණයකි.
(1) කිරීමෙන් (2) කිරීමෙහි (3) කිරීමට (4) කිරීම

● අංක **35** ප්‍රශ්නයේ **තද කළු පැහැයෙන් මුද්‍රිත** සංඛ්‍යාව නිවැරදි ව අකුරෙන් ලියා ඇති පිළිතුර තෝරන්න.
**35** ஆம் வினாவில் **தடித்த எழுத்திலுள்ள** எண் சரியான எழுத்துகளால் எழுதப்பட்டுள்ள விடையைத் தெரிவுசெய்க.
Select the answer in which the number in **bold** print has been correctly written in letters in question No. **35**.

**35.** කැඩී බිඳී ගිය වැව් බැම්ම ගම්වාසීන් එක් ව වැලිමලු **4821** ක් යොදා ගනිමින් තාවකාලික ව පිළිසකර කරන ලදි.
(1) හතළිස් අටසිය විසි එක
(2) හාර දහස් අටසිය විසි එක
(3) හාරසිය අටදහස් විසි එක
(4) හාරසිය අටසිය විසි එක

● අංක **36** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයේ **ව්‍යාකරණානුකූල ව නිවැරදි** වාක්‍යය තෝරන්න.
**36** தொடக்கம் **40** வரையான ஒவ்வொரு வினாவிலும் **இலக்கணரீதியாக சரியான** வாக்கியத்தைத் தெரிவுசெய்க.
Select the **grammatically correct** sentence in each question from No. **36** to **40**.

**36.** (1) මමත්, නංගීත්, මල්ලීත් ඕලු ඇල්ල සහ රිකිලි ඇල්ල නරඹමින් පැමිණ දිය නා කෑම කා විනෝද වූවෙමු.
(2) මමත්, නංගීත්, මල්ලීත් ඕලු ඇල්ල සහ රිකිලි ඇල්ල නරඹමින් පැමිණ දිය නා කෑම කා විනෝද වීමි.
(3) මමත්, නංගීත්, මල්ලීත් ඕලු ඇල්ල සහ රිකිලි ඇල්ල නරඹමින් පැමිණ දිය නා කෑම කා විනෝද වූවේ ය.
(4) මමත්, නංගීත්, මල්ලීත් ඕලු ඇල්ල සහ රිකිලි ඇල්ල නරඹමින් පැමිණ දිය නා කෑම කා විනෝද විය.

**37.** (1) ඉහළ කඳුකර ප්‍රදේශවල වන වගාව අනිවාර්යයෙන් සිදු කළ යුතු බව රජය නිවේදනය කළහ.
(2) ඉහළ කඳුකර ප්‍රදේශවල වන වගාව අනිවාර්යයෙන් සිදු කළ යුතු බව රජය නිවේදනය කළේ ය.
(3) ඉහළ කඳුකර ප්‍රදේශවල වන වගාව අනිවාර්යයෙන් සිදු කළ යුතු බව රජය නිවේදනය කළෝ ය.
(4) ඉහළ කඳුකර ප්‍රදේශවල වන වගාව අනිවාර්යයෙන් සිදු කළ යුතු බව රජය නිවේදනය කරනු ලැබූහ.

**38.** (1) අධ්‍යාපනය සාර්ථක කර ගැනීම සඳහා තාක්ෂණය යොදා ගැනීමට හැකියාව ලැබුණාහ.
(2) අධ්‍යාපනය සාර්ථක කර ගැනීම සඳහා තාක්ෂණය යොදා ගැනීමට හැකියාව ලැබිණි.
(3) අධ්‍යාපනය සාර්ථක කර ගැනීම සඳහා තාක්ෂණය යොදා ගැනීමට හැකියාව ලැබුවෙමි.
(4) අධ්‍යාපනය සාර්ථක කර ගැනීම සඳහා තාක්ෂණය යොදා ගැනීමට හැකියාව ලදිමි.

**39.** (1) මා ගෙදර එන විට අම්මා නංගීට කෑම කවමින් සිටියෙමි.
(2) මම ගෙදර එන විට අම්මා නංගීට කෑම කවමින් සිටියේ ය.
(3) මා ගෙදර එන විට අම්මා නංගීට කෑම කවමින් සිටියා ය.
(4) මම ගෙදර එන විට අම්මා නංගීට කෑම කවමින් සිටියෙමි.

**40.** (1) සුළි කුණාටුව විසින් මහා ගස් ගල් පෙරළමින් ඇළ දොළ ගංගා වැව් පොකුණු විනාශ කරනු ලැබීය.
(2) සුළි කුණාටුව විසින් මහා ගස් ගල් පෙරළමින් ඇළ දොළ ගංගා වැව් පොකුණු විනාශ කරනු ලැබූහ.
(3) සුළි කුණාටුව විසින් මහා ගස් ගල් පෙරළමින් ඇළ දොළ ගංගා වැව් පොකුණු විනාශ කරනු ලබති.
(4) සුළි කුණාටුව විසින් මහා ගස් ගල් පෙරළමින් ඇළ දොළ ගංගා වැව් පොකුණු විනාශ කළහ.

* *

[ 5 වැනි පිටුව බලන්න / பக். 5 ஐப் பார்க்க / *see page five*

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

64 S I, II

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)**
**General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)**

දෙවන බස - සිංහල I, II
இரண்டாம் மொழி - சிங்களம் I, II
Second Language - Sinhala I, II

**දෙවන බස - සිංහල II** **இரண்டாம் மொழி - சிங்களம் II** **Second Language - Sinhala II**

- I කොටසේ අංක 1 හා 2 ප්‍රශ්න ඇතුළුව II කොටසින් **එක්** ප්‍රශ්නයක් ද III කොටසින් ප්‍රශ්න **දෙකක්** ද තෝරා ගෙන ප්‍රශ්න **පහකට** පමණක් උත්තර ලියන්න.

  பகுதி I இல் 1 ஆம் 2 ஆம் வினாக்கள் உட்பட பகுதி II இல் **ஒரு** வினாவையும் பகுதி III இல் **இரண்டு** வினாக்களையும் தெரிவுசெய்து எல்லாமாக **ஐந்து** வினாக்களுக்கு மாத்திரம் விடை எழுதுக.

  Answer only **five** questions including questions 1 and 2 in Part I and selecting **one** question from Part II and **two** questions from Part III.

## I කොටස / பகுதி I / Part I

1. දී ඇති මාර්ගෝපදේශ ඇසුරු කර ගෙන පහත දැක්වෙන මාතෘකාවලින් **එකක්** ගැන **වචන 100**ක පමණ රචනයක් ලියන්න.
   பின்வரும் தலைப்புகளுள் **ஒன்றைத்** தெரிவுசெய்து அதன் கீழே தரப்பட்டுள்ள விடயங்களை அடிப்படையாகக் கொண்டு ஏறத்தாழ **100 சொற்களில்** அமையுமாறு ஒரு கட்டுரை எழுதுக.
   Write an essay of approximately **100 words** on **one** of the following topics using the given guidelines.

   (අ) පුස්තකාල පරිහරණයේ වැදගත්කම
   - (i) හැඳින්වීම
   - (ii) පුස්තකාලවලින් සිදුවන සේවය
   - (iii) පරිහරණය කළ හැකි ආකාරය
   - (iv) එමගින් ලබා ගත හැකි ප්‍රයෝජන
   - (v) සමාලෝචනය

   (ආ) වැඩිහිටියන්ගෙන් ලබා ගත හැකි ආදර්ශ
   - (i) හැඳින්වීම
   - (ii) වැඩිහිටියන් ඇසුරෙහි වටිනාකම
   - (iii) ලබා ගත හැකි ආදර්ශ
   - (iv) ජීවිතය යහපත් කර ගත හැකි ආකාරය
   - (v) සමාලෝචනය

   (ඉ) මා දුටු ලස්සන ම පෙරහැර
   - (i) හැඳින්වීම
   - (ii) පෙරහැර පැවැත්වීමේ අරමුණු
   - (iii) දක්නට ලැබුණු විශේෂ අවස්ථා
   - (iv) පෙරහැර නැරඹීමෙන් ලබා ගත් සතුට
   - (v) සමාලෝචනය

   (ඊ) පෝෂ්‍යජනක ආහාර ගැනීමේ අවශ්‍යතාව
   - (i) හැඳින්වීම
   - (ii) පෝෂ්‍යජනක ආහාර හඳුනා ගැනීම
   - (iii) ශරීර ශක්තිය වර්ධනයට හේතු වන අයුරු
   - (iv) ලෙඩ රෝග අඩු කර ගැනීමට හැකි වන බව
   - (v) සමාලෝචනය

   (උ) ගස්වැල් සුරැකීමේ වටිනාකම
   - (i) හැඳින්වීම
   - (ii) ගස්වැල්වලින් ලැබෙන ප්‍රයෝජන
   - (iii) ගස්වැල් සුරැකීමට කළ හැකි දේ
   - (iv) ගස්වැල් විනාශ වීමෙන් සිදුවන අයහපත
   - (v) සමාලෝචනය

[ 6 වැනි පිටුව බලන්න / பக். 6 ஐப் பார்க்க / see page six

**2.** දී ඇති පින්තූරය බලා, ඒ ඇසුරෙන් අර්ථවත් වාක්‍ය **පහක්** ගොඩනගන්න.
(වාක්‍යයක අවම වශයෙන් වචන **හතරක් වත්** තිබිය යුතු ය.)
தரப்பட்டுள்ள படத்தை அடிப்படையாகக் கொண்டு கருத்துள்ள **ஐந்து** வாக்கியங்கள் எழுதுக.
(ஒரு வாக்கியத்தில் குறைந்தபட்சம் **நான்கு** சொற்களாவது இருத்தல் வேண்டும்.)
Compose **five** meaningful sentences with reference to the given picture.
(There should be at least **four** words in a sentence).



## II කොටස / பகுதி II / Part II

- අංක **3** හා **4** යන ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර සපයන්න.
**3** ஆம் **4** ஆம் வினாக்களுள் ஏதேனும் **ஒரு** வினாவுக்கு மாத்திரம் விடை எழுதுக.
Answer only **one** question from questions No. **3** and **4**.

**3.** පහත සඳහන් කවි පෙළ කියවා, අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.
பின்வரும் கவிதையை வாசித்து, கேட்கப்பட்டுள்ள வினாக்களுக்கு விடை எழுதுக.
Read the following poem and answer the questions given.

මල් සිරි සිරි සිසිරි සිසිරි
මල් වරුසා වහින්නේ
කුඹුර කලල් කර ගන්ඩයි
මේ මල් වැහි වහින්නේ

ඉර අහසේ ඔමරි පපා
හිනා කැරළි පෙළන්නේ
ජයට සැදී කිරි කුරහන්
පීදෙන හැටි බලන්නේ

තක්කිටි තක්කිටි තරිකිටි
ගෙයි අටුකොටු පිරෙයි පිරෙයි
වක්කඩ කැඩුවා විලසට
සතුට දෝර ගලයි ගලයි

ඒ මල් වැස්සේ තෙමී තෙමී
පැළපත රැලි නඟනවාය
බණ්ඩි ඇදී කිරට හැරී
කරල් බිමට නැවෙනවාය

මැ - මුං - තල - අමු - මෙනේරි
හිනැහෙන කොට අත වන වන
මගේ සතුට නළියනවා
හිත ඇතුළේ උඩ පැන පැන

PAST PAPERS WIKI

[ 7 වැනි පිටුව බලන්න / பக். 7 ஐப் பார்க்க / *see page seven*

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(i) මල් වරුසා වහින්නේ කුමක් සඳහා ද?
(ii) ඉර අහසේ ඔමරි පාමින් බලන්නේ කුමක් ද?
(iii) කුඹුරේ වගා කර ඇති වෙනත් භෝග වර්ග **දෙකක්** ලියන්න.
(iv) කවි පෙළෙහි ඇතුළත් උපමාවක් උපුටා ලියන්න.
(v) 'සන්තෝෂය' යන්නට සමානාර්ථ පදයක් කවි පෙළෙන් උපුටා ලියන්න.

**4.** පහත දැක්වෙන ඡේදය කියවා, අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.
பின்வரும் உரைப்பகுதியை வாசித்து, கேட்கப்பட்டுள்ள வினாக்களுக்கு விடை எழுதுக.
Read the following paragraph and answer the given questions.

එදිනෙදා ජීවිතයේදී මිනිසුන් මුහුණ දෙන හදිසි අනතුරු නිසා ශාරීරික වශයෙන් සිදුවන හානි මෙන් ම ජීවිත හානි ද සිදු වේ. මෙවැනි අනතුරු නිවසේදී, මහාමාර්ගයේදී, පාසලේදී සහ ආගමික ස්ථානයකදී වුව ද සිදු විය හැකි ය.

ස්වභාවධර්මයේ ඇති වන හදිසි විපර්යාස නිසා ආපදා තත්ත්ව ඇති විය හැකි ය. ගංවතුර, නායයෑම සහ නියඟය බොහෝ රටවල සුලභව දැකිය හැකි ආපදා ය. අනතුරු සහ ආපදාවලට මුහුණ දීමට සිදු වුවහොත් තමාට, පවුලේ සාමාජිකයන්ට මෙන් ම සමාජයට ද විවිධ මට්ටමින් බලපෑම් ඇති වේ.

වර්තමාන සමාජයෙහි සිදු වන අනතුරු සහ ආපදා ඉතා බහුල අතර මේවා නිසා සිදු වන මරණ සංඛ්‍යාව ද ඉහළ ය.

(i) හදිසි අනතුරු නිසා මිනිසුන්ට සිදු විය හැකි හානි මොනවා ද?
(ii) මෙහි සඳහන් පරිදි හදිසි අනතුරු සිදු විය හැකි ස්ථාන **දෙකක්** නම් කරන්න.
(iii) ආපදා ඇති වන්නේ කුමක් නිසා ද?
(iv) බොහෝ රටවල සුලභව දැකිය හැකි ආපදා මොනවා ද?
(v) 'වෙනස්වීම්' යන්නට සමානාර්ථ පදයක් ඡේදයෙන් උපුටා ලියන්න.

## III කොටස / பகுதி III / Part III

- අංක **5** හා **6** යන ප්‍රශ්න **දෙකට ම** උත්තර සපයන්න.
  **5, 6** ஆகிய **இரண்டு** வினாக்களுக்கும் விடை எழுதுக.
  Answer **both** questions No. **5** and **6**.

**5.** පහත දැක්වෙන තොරතුරු පදනම් කර ගෙන දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න.
பின்வரும் விடயங்களைக் கருத்திற்கொண்டு அறிவித்தலொன்றைத் தயாரிக்குக.
Prepare a notice based on the following information.

ඉසුරුපුර දේවානන්ද මහා විද්‍යාලයේ පරිසර සංගමය ප්‍රදේශයේ මුඩු ඉඩම්වල පලතුරු පැළ සිටුවීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට අදහස් කරයි. අවශ්‍ය පැළ සපයා ගැනීමටත් ඒවා සිටුවීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙළ පිළිබඳ දැනුවත් කිරීම සඳහාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහාය ලබා ගැනීමට අපේක්ෂා කරයි. ඒ පිළිබඳ රැස්වීමක් අදාළ නිලධාරියකුගේ සහභාගිත්වයෙන් 2026 මාර්තු 28 වන දින ප.ව. 2.00ට දේවානන්ද මහා විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී පැවැත්වීමට සැලසුම් කර ඇත.

පහත සඳහන් කරුණු ඇතුළත් කරමින් ප්‍රදේශවාසීන් දැනුවත් කිරීම සඳහා සුදුසු දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න. (ඔබ පරිසර සංගමයේ ලේකම් අවිෂ්ක කුඩාහෙට්ටි යැයි සිතන්න.)

- රැස්වීමේ අරමුණු සහ වැදගත්කම
- ගම්වැසියන්ට ලැබෙන ප්‍රයෝජන
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලැබෙන සහාය

**නැතහොත්**
**அல்லது**
**Or**

පහත දැක්වෙන තොරතුරු පදනම් කර ගෙන අදාළ ආයතනයේ කළමනාකරු වෙත යැවීමට සුදුසු රාජකාරි ලිපියක් ලියන්න.
பின்வரும் விடயங்களைக் கருத்திற்கொண்டு உரிய நிறுவனத்தின் முகாமையாளருக்கு அனுப்புவதற்குப் பொருத்தமான உத்தியோகபூர்வக் கடிதமொன்றை எழுதுக.
Based on the following information write an official letter to be sent to the manager of the relevant institute.

[ 8 වැනි පිටුව බලන්න / பக். 8 ஐப் பார்க்க / *see page eight*

ඉසුරුපුර පිහිටි 'වින් ශ්‍රී ලංකා' ආයතනය පලතුරු ආශ්‍රිත නිෂ්පාදන අපනයනය හා රටපුරා බෙදාහැරීම සම්බන්ධයෙන් මහත් ප්‍රසිද්ධියක් උසුලන පෞද්ගලික සමාගමකි. ඉසුරුපුර දේවානන්ද මහා විද්‍යාලයේ පරිසර සංගමය තම සාමාජිකයන්ට මෙම ආයතනයේ කටයුතු නැරඹීමට සහ අධ්‍යයනය කිරීමට අවස්ථාව ලබා දීමේ අරමුණින් චාරිකාවක් සංවිධානය කිරීමට අදහස් කරයි.

පහත සඳහන් තොරතුරු ඇතුළත් කොට, ඒ සඳහා අවස්ථාවක් ලබා දෙන ලෙස ඉල්ලමින් ආයතනයේ කළමනාකරු වෙත යවන ලිපිය ලියන්න. (ඔබ පරිසර සංගමයේ ලේකම් අවිශ්ක කුඩාහෙට්ටි යැයි සිතන්න.)

- සහභාගි වීමට අපේක්ෂිත සංඛ්‍යාව
- දිනය සහ වේලාව
- මෙම චාරිකාව සංවිධානය කිරීමේ අරමුණු

**6.** පහත දැක්වෙන දෙමළ / ඉංග්‍රීසි වාක්‍ය **සිංහලට** පරිවර්තනය කරන්න.
கீழே தரப்பட்டுள்ள தமிழ் / ஆங்கில வாக்கியங்களை **சிங்களத்தில்** மொழிபெயர்க்க.
Translate the following Tamil / English sentences into **Sinhala**.

(i) வைத்தியர் நோயாளியைப் பரிசோதிக்கிறார்.
The doctor is checking the patient.

(ii) நாங்கள் காலையில் பாடசாலைக்கு வந்தோம்.
We came to school in the morning.

(iii) நாங்கள் கணினி பாடநெறிக்கான கட்டணத்தை திங்கட்கிழமை செலுத்துவோம்.
We will pay the fee for the computer course on Monday.

(iv) மாணவர்கள் விடுமுறைக்குப் பின்னர் வகுப்பறைகளைச் சுத்தம் செய்தார்கள்.
Students cleaned the classroom after the vacation.

(v) கொழும்பிலுள்ள அருங்காட்சியகத்திற்குச் செல்வோம்.
Let's go to the museum in Colombo.

**නැතහොත்**
**அல்லது**
**Or**

පහත සඳහන් තොරතුරු පදනම් කර ගෙන සංවාදයක් ලියන්න. (වාක්‍ය **10ක්** ප්‍රමාණවත් වේ.)
பின்வரும் தகவல்களை அடிப்படையாகக் கொண்டு உரையாடல் ஒன்று எழுதுக. (**10** வாக்கியங்கள் போதுமானவை.)
Write a dialogue based on the following information. (**10** sentences are enough.)

කර්මාන්ත අමාත්‍යාංශය ස්වයං රැකියාවල නියුතු අය වෙනුවෙන් අඩු පොලියට සහනදායී ණය ක්‍රමයක් මෑතකදී හඳුන්වා දී ඇත. බිම්මල් වගාවේ නිරත ඔබට, ඔබගේ කර්මාන්තය වැඩිදියුණු කර ගැනීමට මෙය මහඟු අවස්ථාවක් වන බැවින් මේ පිළිබඳ වැඩි විස්තර දැනගැනීම සඳහා අදාළ නිලධාරියකු සමග සිදුකරන සංවාදය ලියන්න.

- නිලධාරියා මුණගැසීම හා සුබ පැතීම
- අදාළ කරුණු සම්බන්ධයෙන් තොරතුරු විමසීම
- සමුගැනීම


* * *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න


# 11 ශ්‍රේණිය කෙටි සටහන් පොත් සංශෝධිත නව විෂය නිර්දේශයේ පාඩමෙන් පාඩමට




Rs : 300





Rs : 300




Rs : 300





Rs : 300





Rs : 300





Rs : 300




Rs : 350




Rs : 300




Rs : 300




Rs : 200





Rs : 200





Rs : 200





Rs : 250





Rs : 250





Rs : 200





Rs : 200




Rs : 200





Rs : 300





Rs : 300




Rs : 200




Rs : 200




Rs : 250





Rs : 650


මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
koko
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE


# 11 ශ්‍රේණි ඉංග්‍රීසි මාධ්‍ය කෙටි සටහන් පොත් ENGLISH MEDIAM SHORT NOTE BOOKS Rs 180/-





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180

**මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.**


LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE